**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
-----------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**
---------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 4 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
------

මෙම වාර්තාවේ1.3.2 හා 1.3.6 ඡේදවල දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
--------------------------------------

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
-------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
---------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) “ දොරින් දොරට ගමින් ගමට ” වැඩසටහන යටතේ ඉටුකර තිබුණු එකතුව රු. 22,378,309 ක් වූ කර්මාන්ත 12 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ආ) 2004 හා 2005 යන වර්ෂවලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබූ ණය මුදල් වලට අදාළව ගෙවිය යුතු එකතුව රු.42,464,452 ක් වූ පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) එකතුව රු. 1,161,289 ක් වූ ප්‍රාග්ධන වියදම් වර්ෂයේ වියදම් වලින් හා වර්ෂය අවසානයේ ණයහිමි ශේෂයෙන් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ලැබිය යුතු රු.197,754 ක උසාවි දඩ මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිර්දේශ අනුව වෙන්දේසි කර ඉවත් කර තිබූ එකතුව රු.296,782 ක් වූ වත්කම් වල පිරිවැය ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව සතු ට්‍රැක්ටර් ට්‍රේලරයක හා පැජරෝ රථයක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.3 නොසැසඳු පාලන ගිණුම්**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 8 ක ශේෂයන් සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු. 1,973,998 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

--------------------

(අ) ඉකුත් වර්ෂවලට අදාළ රු.147,600 ක් වූ හිග වාහන ආදායම් හා රු.51,870 ක් වූ හිග සතිපොළ ආදායම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයට අදාළ රු.13,950 ක ණය ශේෂයක්ද, සේවය අත්හිටුවීම මත ඉකුත් වර්ෂයට අදාළ රු.118,098 ක ණය ශේෂයක්ද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

------------------

(අ) 2004 සහ 2005 යන වර්ෂ වලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.40,647,702 ක ණය මුදලින් හා ඊට අදාළ රු.42,464,452 ක් වූ පොලී මුදලින්ද, කොටසක් හෝ ගෙවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.408,822 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් හා ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

වටිනාකම රු. 2,500,000 ක් වූ ඉඩමකට හා වටිනාකම් සඳහන් නොවූ ඉඩම් 17 කට අදාළ හිමිකම් ඔප්පු/පැවරුම් නියෝගද, එකතුව රු.208,649 ක් වූ ආරම්භක අත්තිකාරම් ශේෂයට අදාළ උපලේඛනද, එකතුව රු. 17,639,881 ක් වූ ණයගැති ශේෂවලට අදාළ කාල විශ්ලේෂණද, එකතුව රු. 177,857 ක් වූ විවිධ තැන්පත් හර ශේෂය උද්ගතවීමට හේතුද, ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය.

## 1.3.7 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2015 මැයි 21 දිනැති අංක 15/ විවිධ (051) දරන අමාත්‍ය මණ්ඩල තීරණය | යොමුගත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවී හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ක්‍රීඩා උත්සවය වෙනුවෙන් රු. 214,330 ක් හා සභාවේ නිලධාරීන්ගේ වාර්ෂික චාරිකාව වෙනුවෙන් රු. 80,000 ක් සභා අරමුදලින් වියදම්කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | කල් ඉකුත් වූ රු. 1,552,063 ක තැන්පතු ශේෂ 449 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 7,033,766 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 9,608,934 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,575,168 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ ස්වයං උත්පාදන ආදායම් ප්‍රමාණය ඉක්මවා ඉකුත් වර්ෂ දෙකේදී සහ සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

(ආ) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාව නොලැබෙන බව පෙන්නුම් කෙරේ.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලෙහි රු. 10,712,754 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණු අතර, වර්ෂය අවසානයට එම ගිණුමේ හර ශේෂය රු.11,304,323 ක් වී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

---

### 2.3.1 වරිපනම් හා බදු

---

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.3,632,574 ක් වූ අතර, දීර්ඝ කාලීනව බදු මුදල් අය නොවන බදු ඒකක 20 කින් අයවිය යුතු රු. 710,535 ක ශේෂයක්ද, මෙම හිඟයට ඇතුළත්වී තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා හිඟ ශේෂය ඉහළ අගයක් ගෙන තිබුණි.

### 2.3.2 බදුකුලී

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) සතිපොළ බදුදීම**

---

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 177 වැනි රීතිය ප්‍රකාර පන්නෙගමුව හා දෙබරවැව යන සතිපොලවල් සමාලෝචිත වර්ෂය සඳහා ටෙන්ඩර් කර බදුදීමට ක්‍රියාකර නොතිබුණි.

(ii) සභාව විසින් මෙම සතිපොළවල් ටෙන්ඩර් කර බදුදීමට කටයුතු කළේ නම් බදුකරුවන් වෙනුවෙන් සියයට 22 ක කොමිස් මුදල් ලෙස 2014 වර්ෂයේදී ගෙවූ රු. 709,027 ක මුදල සහ 2015 වර්ෂයේදී ගෙවූ රු. 875,309 ක මුදල ඉතිරිකර ගැනීමට සභාවට හැකියාව තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) කඩකාමර කුලී**

---

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) සභාව විසින් ස්ථාන 10 ක පිහිටි කඩ කාමර 258 ක් සඳහා නව තක්සේරු ලබා ගැනීමට කටයුතු නොකර, 2007 වර්ෂයේදී ලබාදී තිබූ තක්සේරු වාර්තාව පදනම් කරගෙන කුලී අය ති.

(ii) දෙබරවැව පොදු වෙළඳපොල ඉදිරිපිට කඩ කාමරයක බදුකරුගෙන් අයවිය යුතු රු. 109,868 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ඇ) නිවාස කුලී**

**------------**

සභාව සතු නිවාස වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවතුණ රු.91,011 ක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 510,672 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.7,933,910 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1 කාර්ය සාධන ඇගයීම**

**-----------------------**

2015 වාර්ෂික අයවැය යෝජනා මගින් සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග 26 න් මාර්ග 2 ක් පමණක් සංවර්ධනය කර තිබූ අතර, ඉතිරි මාර්ග 24 හි සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

මුදල් රෙගුලාසි 780(1) අනුව රජයේ වැඩ හා සේවා අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටුකළ යුතු වුවත්, සභාව විසින් සිදුකරන ලද ඉදිකිරීම් කාර්යයන් සඳහා සභාවේ ටිපර් රථ හා බැකෝ යන්ත්‍රය යොදා නොගෙන, කුලී පදනම මත එම වාහන හා යන්ත්‍රෝපකරණ ලබා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් රු. 1,376,375 ක වියදම් දැරීමට සිදුවී තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) වායුසමන යන්ත්‍ර හා CCTV කැමරා පද්ධතියක් මිලට ගැනීම**

**-----------------------------------------------------------------**

වායුසමන යන්ත්‍ර මිලට ගැනීමට රු. 1,403,850 ක් ද, CCTV කැමරා පද්ධතියක් මිලට ගැනීමට රු. 148,650 ක් ද වැයකර තිබූ නමුත්, ඒවායේ සේවා සැපයීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය ප්‍රකාරව ලිඛිත ගිවිසුම් වලට එළඹී නොතිබුණි. මිල කැඳවීම් වලට අයත් නොවන වර්ගයක වායුසමන යන්ත්‍රයක්ද සපයා සවි කර තිබුණි.

(ආ) **අංක LE – 7462 දරන කැබ් රථයට නව එන්ජිමක් සවිකිරීම**

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 177 වැනි රීතියට අනුකූල නොවී මිල ගණන් කැඳවීමකින් තොරව, රථයේ ලියාපදිංචි තොරතුරු ඉදිරිපත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන රු.330,00 ක වියදමින් නව එන්ජිම සවි කර තිබුණි.

(ඇ) **දකුණු පළාත් සංවර්ධන සැලැස්ම**

2014 වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ තෝරාගත් පෙර පාසල් සඳහා උපකරණ ලබාදීමට ලැබී තිබුණු රු.50,000 ක මන්ත්‍රී ප්‍රතිපාදන අදාළ යෝජනාවට යොදා නොගෙන පෙර පාසල් ළමුන්ගේ ඡායාරූප ගැනීම සඳහා රු.38,125 ක වියදම් දරා තිබුණි.

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සියළු උපාංග සහිතව එල්ලෙන ලාම්පු 10 ක් සපයා සවිකිරීම වෙනුවෙන් ඒකකයකට රු. 2,110 ක් බැගින් රු. 21,100 ක් ගෙවීම් කර තිබුණි. ඒකකයකට ගෙවීම් කර ඇති මිල ගණන් අනුව CFL බල්බ් සපයා සවිකළ යුතු වුවත්, සාමාන්‍ය විදුලි බල්බ සපයා සවිකර තිබුණි.

(ආ) **තිස්සමහාරාම මහජන පුස්තකාලයේ සහ තිස්සමහාරාම ආයුර්වේද ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය සකස් කිරීම**

යොමුගත ගොඩනැගිලි දෙකෙහි විදුලි පද්ධති වෙනුවෙන් උපදෙස් පරිදි සියළු උපාංග සහිතව පිළිවෙලින් එල්ලෙන ලාම්පු 06 ක් සහ 08 ක් සපයා සවිකිරීම වෙනුවෙන් ඒකකයකට රු. 2,110 ක් බැගින් පිළිවෙලින් රු.12,660 ක් සහ රු.16,880 ක් ගෙවීම් කර තිබුණි. ඒකකයකට ගෙවීම් කර ඇති මිල ගණන් අනුව CFL බල්බ් සපයා සවිකළ යුතු වුවත්, සාමාන්‍ය විදුලි බල්බ සපයා සවිකර තිබුණි.

## 3.5 බලය නොලත් ගනුදෙනු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 මැයි 05 දිනැති අංක 1/2014 දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ අංක 3 ඡේදයේ ඇතුළත් නොවූ කාර්යයක් වෙනුවෙන්, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2014 දෙසැම්බර් 26 දින ලැබී තිබුණු රු.1,000,000 ක මුදල වැය කර තිබුණි.

(ආ) 2015 අප්‍රේල් 28 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය පරිපාලන, ලේකම්ගේ චක්‍රලේඛයේ 2.8 ඡේදයට අනුකූල නොවී, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහනට ලැබී තිබුණු අරමුදල් යොදවාගෙන ටයර් මිලදී ගැනීමට සහ වාහන අලුත්වැඩියා කිරීමට රු. 432,410 ක වියදම් දරා තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 21 ක් සඳහා වූ රු.649,000 ක සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරි කිරීම්ද, තවත් වියදම් විෂයයක සීමාව ඉක්මවා රු.2,677,493 ක වියදම්ද, ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් එකතුව රු.19,219,976 ක් වූ ඉලක්කයන්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ. දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

--------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින රෙදි මහන උපකරණ, මෝටර් බෝට්ටු දෙකක්, ශාරීරික ව්‍යායාම් උපකරණ, අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය ඇතුළු උපකරණ ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**(ආ) භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------

2015 භාණ්ඩ සමීක්ෂණයෙන් පෙන්වාදී තිබූ භාණ්ඩ වර්ග 176 කට අයත් භාණ්ඩ ඒකක 590 ක ඌනතා සම්බන්ධයෙන් 2016 මැයි 17 දින වන විටත් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 204 අනුව කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන්ට ලබාදී ඇති වත්කම්**

**---------------------------------------**

වර්ෂ ගණනාවකට පෙර කටුවන ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබුණු අහුල නැවත ලබා ගැනීමට 2016 මැයි 17 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.5 බේරුම් නොකළ බැරකම්**

**---------------------------**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ බේරුම් නොකළ බැරකම්වල මුළු වටිනාකම රු. 10,958,799 ක් වූ අතර, ඉන් රු. 3,435,317 ක් වූ ශේෂ ඉකුත් වර්ෂවලට අදාළ ඒවා විය.

**5. පද්ධති හා පාලන**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය